

# කවුළුව



# චරියා රටා

හෙන්රි ඩී කුමාරප්පෙරුම සිනුවර සිට

## 'රටා වියපු අත් දෙක මට සිහි වෙනවා'

කලාත්මක ලෙස රටා මවමින් හැඩ ගන්වමින් පැදුරක් වියන ගැමි කාන්තාවකත්, ගීත රචකයකුගේ මනෝ භාවයන් තුළින් පිබිදි පද ලාලිත්‍යයෙන් බිහි වූ ගීතයකිනුත්, ගායකයකුගේ ලයාන්විත ගී හඬකිනුත්, යන තුන් කොන් චරියාවලියක් මෙම ගීත ඛණ්ඩයට ඇතුලු වී ඇති අයුරු හදවතට යමක් පවසයි.

අපට නිතර ඇසීමෙන් සන්තාන ගතවන හා දැකීමෙන් යම් හැඟීම් දනවන්නාවූ ද කිසියම් රූප සමුදායක් රටා ලෙස හැඳින් විය හැකිය. එක ම පාට පන් කොළ සමූහයකින් පැදුරක් විවීමේ හැකියාවක් ඇත. එහෙත් වර්ණ කිහිපයක සංකලණයෙන් වර්ණවත් කරන ලද පන් කොල යොදා යම් යම් රටා, හැඩ තල මවමින් කළ වියමනහැඩයෙන් වැඩිය. අගයෙන් ද වැඩිය. එය ගැන කථා කිරීමට දෙයක් ඇත. කවියකින් ගීතයකින් වර්ණනාවක් කිරීමෙන් කෙනෙක් එයට විශේෂත්වයක් ආරෝපණය කිරීමට පෙළඹෙති.

එසේ පැදුරකට එක්වූ වැනි රටා සමුදායක් ගායකයා තුළ ද රචකයා තුළ ද ගෙවිලිය තුළ මෙන් ම අනෙකුත් ජීවිත තුළ ද දක්නට ඇත. එම තත්වයන් ජීවන චර්යා රටා බව පෙන්නුම් කිරීමට මෙය කදිම අරමුණක්. ඒ කෙසේ විය හැකිද? මනෝ මූලයන් පදනම් කර ගනිමින් චර්යා රටා ගොඩනැගෙන බව 'ඩුර්කයිම්' හෙළි කළ සමාජ මනෝ විද්‍යාව පැහැදිළි කරයි.

කුරා කුහුඹුවාගේ පටන් දිය ගොඩ සරනා සතුන්ගේ පමණක් නොව විවිධ වූ ජීව සන්තතීන් තුළ දකින්නට ලැබෙන ක්‍රියාවලිය මෙයට අන්තර්ගතයි. මිනිස් චර්යා රටා අපි හොඳින් හඳුනමු. දෛනිකව මුණගැහෙන හා ඇසුරෙහි පසු වන අය පිළිබඳ කිසියම් මිනුම් දඬු අන් අයගේ සිත්වල තැන්පත් කර ගන්ම සිරිතක්. එය හොඳ හෝ නරක විය හැකියි. ' අයියෝ එයාගෙ ගති පැවතුම් මට අල්ලන්නෙ නැහැ' යැයි කෙනෙක් කියනු ඔබ කොතෙකුත් අසා ඇත.

ඒවගේ ම 'එයා හොඳ කෙනෙක් මහාත්ම ගති ගුණ ඇත්තෙක්' කියා ද පවසනු අසා ඇත. එසේ කියන ඔබ ද කිසියම් ගති ලක්ෂණ වලින් යුතු අයෙක් වීම ද සාමාන්‍ය දෙයකි. මෙය අපි හැසුරුම් විලාශය ලෙස හඳුනමු. අප හැම කෙනෙක් ම ගත් විට ඔවුනොවුන්ට හිමි රූපන රටාව දැන හෝ නොදැන ද තම ක්‍රියාකාරිත්වය තුළින් හෙළි කරමින් ඇත. මේ අයුරින් මානව චර්යාවේ ඇතිවන වෙනස්කම් නිසා ම හැම කෙනෙක් ම වර්ගීකරණයට භාජන වී ඇත.

ජැන්ඩියා, චණ්ඩියා, මෝඩයා, කුහකයා, අසරණයා, දුෂ්ටයා, පවුකාරයා, පුරාජේරු කාරයා, හෝ වෙනත් ආදේශ නමකින් සමාජය නොපිළිගන්නා හෝ පිළිකුල් කරන අය හැඳින්වීම සමාජය තුළ අසන්නට දකින්නට ලැබෙන දෙයක්. දාන පතියෙක්, වැදගතෙක්, කාරුණිකකෙනෙක්, හිත හොඳ කෙනෙක්, හොඳ ගතිගුණ ඇත්තෙක් හෝ වාසනාවන්තයෙක් වැනි වදන් හොඳ චර්යා සමුදායකට හිමිකම් කියන අයවලුන් පිළිබඳ හැඟීමක් දැනවීමට භාවිතා කෙරේ. දෙමාපිය දූදරුවන් අතර මෙන් ම අසල් වැසියන් අතරත්, පුලුල් සමාජය තුළත් ඇති වන අන්තර් පුද්ගල සබඳතා වලදී කවර සමාජයකත් මිනිසුන් තුළත් දක්නට ඇති චර්යා රටා සමූහය මේ ආදී ලෙසින් ඉතා අධිකයි.

'හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ' යැයි පිරුලු වදනක් අසා ඇත. යම් බීජයක් අංකුරයක් වී පොළොවෙන් උඩට මතුවී ටික දිනකට පසු එහි පෙති වැඩෙන්නට පටන් ගනී. එහි මුල් පෙති දෙක දුටු විගසින් ම එම පැලය හොඳින් ඩැඩෙනවාද නැතිනම් එය නොවැඩෙන පැලයක් දැයි කීමට හැකියාවක් ඇත. බාහිර බලපෑම් වලින් උවදුරක් නොවේ නම් එම අනාවැකිය සපල වනු ඇත. එමෙන් ම කුඩා ළමයකුගේ හැසිරීම් පිළිවෙළ අනුව ඔහුගේ චර්යා රටාව අනුව ඔහු ද මොන තරම් දුරට අනාගතයේ ඉහළ හෝ පහළ තැනකට පත් වනු ඇති පුද්ගලයෙක්දැයි පැවසීමට තව කෙනෙකුට හැකි බව මින් පැවැසේ. චර්යාවට ද බලපෑ හැකි බාහිර සාධක එමට බව ද අමතක කළ යුතු නැත.

කුඩා ළමයකු ගේ චර්යාවක ස්භාවය දෙමාපිය වැඩියිටි බලපෑමකින් තොර අවස්ථාවක ක්‍රියා කලාපය ස්වාධිනය. ළමයාට අධ්‍යාපනය ලබාදීම කෙරෙහි පාසැලෙන් පිටත දැඩි ලෙස සිදු වන දෙමාපිය බලපෑම් අවස්ථාව නියම චර්යා රටාවෙන් බැහැර වූවකි. ඒ අවස්ථාවල ළමයා ලිවීමෙහි කියවීමෙහි දී හැසිරෙන්නේ මාපිය උවමනාව යටතේ නිසා ස්වාධීනත්වයෙන් තොරය. එම කටයුතු නිම වූ විගස නිදහස් චර්යාවට එළඹෙන අයුරු දැකිය හැකිය. හඬා වැළපී හෝ තමන්ට අවශ්‍ය දේ ලබා ගැනීම, බිම දැඟලීම, අක්කා හෝ මල්ලී සමග අඩ දබර කර ගැනීම, කෑමට කැමැත්ත හෝ අකමැත්ත දැක්වීම, පැණි රසට ඇලුම් කිරීම හෝ මාපියන් විසින් වළකනු ලබන දේ කිරීමට කැමති වීම ආදී ලක්ෂණ ඔහු තුළ දැක ගත හැකිය.

**ජැන්ඩයා, චණ්ඩයා, මෝඩයා, කුහකයා, අසරණයා, දුෂ්ටයා, පවුකාරයා, පුරාජේරු කාරයා, හෝ වෙනත් ආදේශ නමකින් සමාජය නොපිළිගන්නා හෝ පිළිකුල් කරන අය හැඳින්වීම සමාජය තුළ අසන්නට දකින්නට ලැබෙන දෙයක්.**

උදයේ මා ගමන් ගන්නා බස් රියේ ගමන් ගන්නා පාසැල් ළමා පිරිසකි. වයස් කාණ්ඩය හත අට පමණ ඇත. එකම පාසැලට යන ගැහැණු පිරිමි ළමා පිරිස අට දෙනෙකි. මොවුනතරින් එක පිරිමි දරුවෙක් හැරුණු විට අන් සැවොම හුරුබුහුටි ලෙස අංග චලනයෙන් හා කතාබහින් නොයෙකුත් දේ පවසමින් සිනාසෙමින් චරියා රටා මවති. අනෙක් පිරිමි දරුවා පොත් බෑගය අතනොහැර හොඳින් එක්තැන්වී සෙස්සන්ගේ වදන් වලට සවන්දී වාඩිවී සිටී. ඇතැම් විට සෙස්සන් කරන දේ බලමින් සිනාසෙයි. බස්රථය පාසැළ ඉදිරියේ නවතයි. සැවොම රියදුරු තැනට ස්තුති කර බසයෙන් බැස සුපුරුදු කතාවෙන්ම පාසැලට හෙමින් යති. යන අවස්ථාවේ ද පොත් බෑගය බිම තැබීම, ඉන් බෝලයක් හෝ වෙනත් බඩුවක් අතට ගෙන වෙනස් චර්යාවක යෙදීම වැනි ඒකායන නොවූ සිද්ධීන් හා සම්බන්ධ වීමට ඔවුහු යුහුසුලු වෙති. ඒ ඔවුන් සතු වූ චරිත ලක්ෂණයි.

එහෙත් අවසනට බසයෙන් බසින ඉහතකී දරුවා ද එසේ ම ස්තුති කර බසයෙන් බැස්ස ගමන් එතැන් සිට කා ගැන වත් නොබලා එක සිරිතට ඈත පන්තිය වෙතට ම එක පිම්මට නොනැවතී දුහගෙන යෑම සිරිත ය. ඒ ළමයා ගේ චර්යා රටාව එක ම අයුරකින් සතියේ දින පහේ ම සිදු වේ. පෙර කී ළමුන්ට වඩා වෙනස් ගති ලක්ෂණ එම දරුවා තුළ දක්නට ලැබීම විශේෂත්වයකි.

ඒ උදෑසන ඇස ගැසෙන සාමාන්‍ය දෙයින් වෙනස් වූ දසුනකි.

ඉන් නිගමනය කළ හැකි දෙය වනුයේ එම දරුවා ගේ දවසේ අනෙකුත් අවස්ථාවලදී ද කිසියම් ක්‍රමික පිළිවෙළකින් වැඩ කරනු ඇතිබවයි. එම දරුවා තුළ අනෙකුත් සමාන වයස් කාණ්ඩ දරුවන් සේ නොවන ක්‍රියා කළාපයක් දැකිය හැකි වීම කිසියම් බාහිර බලවේග විසින් පාලනය වී ඇති බව සිතා ගත හැකිය. ඒවා නම් තම රැකවරණය, දෙමාපියන් හෝ වැඩිහිටියන් විසින් කැරුණු බලපෑම, කුඩා ළමුන් පැහැරගෙන යෑම ගැන සිතේ පවතින බිය. තම පන්තියේ ම මිතුරන් හා එක්වීමේ ආසාව, කල් තියා පන්තියට පැමිණීම වැනි දේ විය හැකිය. කෙසේ වෙතත් ළමා වියේ සිට මේ දක්වන චර්යා පටිපාටිය ජීවිතයට යම් බලපෑමක් ඇති කරනුලබන බව පෙනීයයි.

මේ අයුරින් ම කෙනෙක් කලබලකාර දඟ කාර අන් අය නුරුස්නා ක්‍රියාකාර කම් වල යෙදෙන ළමයින් ඔවුන්ගේ ඉදිරි ගති සිරිත් ද කෙසේ වනු ඇත්දැයි අනාවැකි පෙන්නුම් කරති. අප බොහෝ විට අසා ඇති දෙයක් නම්, 'කුඩා අවදියේ දඟකාර නොදැමුණු වැඩ කරන සමහර දරුවෝ අනාගතයේ හික්මුණු දැමුණු අය බවට පත්වෙති' යන්නය. එහි සම්පූර්ණ වූ සත්‍යයක් ඇති වන්නත්, නැති වන්නත් පුලුවන් කමක් ඇත. ඒ සඳහා බලපෑ හැකි බාහිර ප්‍රවනතා ඇතිවිය හැකි බැවිනි. සමාජ යේ අදාළ පුද්ගල කණ්ඩායම් තුළින් ඔවුන් ලබා ගන්නා ආභාෂය මීට හේතු වනු ඇති බව සමාජ විද්‍යාව විග්‍රහ කරයි. සමාජානුයෝජනය හෙවත් අන්තර් පුද්ගල සබඳතා මගින් සමාජයට අනුයුක්ත වීම සිදුවන බැවින් අනාගත වෙනස්වීම් සිදුවිය හැකි බව මෙයින් පැහැදිළි කෙරේ.

මෙලෙසින් ඔවුනොවුන් සතු ගති සිරිත් විග්‍රහ කිරීම හුදෙක් සමාජ ගත පුද්ගල චර්යාවන් පැහැදිළි කිරීමක් මිස හොඳ නරක පිළිබඳ විනිශ්චයක් නොවන බව සමාජ විද්‍යාවෙන් විග්‍රහ කෙරේ. මේ අතර, ආචාර දර්ශනය අනුව නම් එම චර්යා හොඳ හෝ නරක ලෙසින් ගැඹුරු ලෙස වර්ග කරමින් සමාජයට කරුණු පැහැදිළි කරයි. ආදරය කරුණාව ප්‍රසාදය හෝ අප්‍රසාදය ද අලස කම, ක්‍රියාශීලී නොවන ගතිය මනෝ භාවයන් මුල් කොට ගෙන උපදින කායානුගත ධර්මතා රාශියක් ගැන අපි අසා ඇත්තෙමු. එම භාවයන් පුද්ගල චර්යාවක් ලෙසින් ප්‍රතික්‍රියාවකට නැගෙන හැටි අපි දැක ඇත්තෙමු.

මෙම ප්‍රතික්‍රියා ස්වභාවයන් විවිධ ලෙසින් පුද්ගලයා තුළින් එළි දකිනවා පමණක් නොව ඉන් පුද්ගලයාට හෝ කණ්ඩායමට ඇති වන විවිධ බලපෑම් අවස්ථා එමටය. මේවා පුද්ගල චර්යාවේ දී සංකීර්ණ ක්‍රියාවලින් ලෙසින් පෙන්නුම් කර ඇත. සමාජානුයෝජනයේදී විශ්වාස, ආකල්ප, අගයන් හා ධර්මතා ලෙසින් වැඩි දුරටත් සමාජයේ පුද්ගලයන් තුළ දක්නට ඇති චරියා රටාවන් විසින් එක්තරා දුරකට සමාජ සංස්ථාව ද ක්‍රියාත්මක කරනුලැබ ඇත.

විද්‍යා ගවේශන කණ්ඩායමක්, විද්වත් පිරිසක්, පාලක පිරිසක්, වැඩි පිරිසක් හෝ සොර කල්ලියක්, මැර කල්ලියක් යන මේ කවර කණ්ඩායමක වුවත් පුද්ගල චර්යාව කණ්ඩායම් හා සංස්ථා ගත රටා පරිපාටියක ස්වභාවය හඟවනු ඇත. පොදුවේ හමුදාවක් ගත්විට එම ලක්ෂණ පැහැදිළිව පෙනේ. එහි ඇත්තේ සංස්ථා ගත විධිමත් සමාජ චර්යා රටාවකි. චර්යාවන්ගේ පැවැත්ම වෙනස් වෙනස් රටා මවමින් සිදුවන බව මෙයින් පැහැදිළිවේ.

රටවල් 40ක සිට ශ්‍රී ලාංකිකයන් අසන ගුවන්විදුලිය - තිසර www.thisara.com